"රූමත්", "ලස්සන" වැනි විශේෂණයන් උපයෝගී කරගනිමින්, පුවතකට අදාළ නොවන කාන්තා බාහිර රූපය ඉස්මතුකොට දැක්වීමේ භාවිතාවක් ඇතැම් මාධ්‍ය අනුගමනය කරයි.

මෙයට නිදසුනක් ලෙස, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරියක ලෙස සහ තවත් විටෙක ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකුගේ දියණිය ලෙසින් පෙනී සිටිමින්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් ගෙන් මුදල් වංචාකල අයෙකු අත්අඩංගුවට ගැනීම සම්බන්ධව පුවතක් අරුණ පුවත්පතේ (සැප්තැම්බර් 15, 2023) පළ වී තිබූ ආකාරය විමසා බැලිය හැක.

මෙම පුවත් වාර්තාවේ දැක්වෙන ආකාරයට,

01) අත්අඩංගුවට පත් සැකකාරිය, "ලස්සන", "ප්‍රියමනාප" සහ "රූමත්" යැයි දක්වා ඇත්තේ මන්ද? එම සැකකාරියගේ බාහිර ස්වරූපය මෙම පුවතට කෙතරම් අදාළ වන්නේ ද?

02) මෙසේ සැකකාරියගේ පුවතට අදාළ නොවන බාහිර රූපය අරුණ පුවත මගින් ඉස්මතු කොට දක්වා ඇත්තේ මන්ද?